
# ඉබ් හාමි



තයිෂි දනුල්යා හැන්නැදිගේ

1 ශ්‍රේණිය A

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

# ඉබි හාමි



## තයිෂි දනුල්යා හැන්නැදිගේ

1 ශ්‍රේණිය A

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

කෘතියේ නම : ඉබි හාමි

ප්‍රථම මුද්‍රණය : 2023.11.15

කතාව සහ චිත්‍ර : තයිෂි දනුල්‍යා හැන්නැදිගේ

කතෘගේ ලිපිනය : අංක: 137, ලේවැල්ල පාර, නුවර

පාසල : මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර.

ශ්‍රේණිය : 1 ශ්‍රේණිය ඒ

ISBN අංකය : ISBN 978-624-206-987-6

පරිගණක අක්ෂර, පිටු සැකසුම හා වර්ණ ගැන්වීම්
අධීක්ෂණය : එම්. එස්. පී. බණ්ඩාර

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

# පිදුම

ආදරණීය තාත්තාට, අම්මාට, අයියාට.

සිප්සතර කියාදුන් මාගේ මුල්ම ගුරුවරුන් වුනු

දමයන්ති ගුරුමෑණියන්ට,

සමන්මලි ගුරුමෑණියන්ට,

ප්‍රාථමික අංශයේ විදුහල්පතිනියට

සහ

කියවීමට කැමති සියළු දෙනාට.

# හැඳින්වීම

මෙම පොත "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය යටතේ මහාමායා බාලිකා විද්‍යාලයේ 1 ශ්‍රේණිය ඒ පංතියේ තයිෂි දනුල්යා හැන්නැදිගේ ශිෂ්‍යාව විසින් නිර්මාණය කළ කතාවක් හා චිත්‍ර ඇතුළත් පොතකි.

# ස්තුතිය

පොත් ලිවීමට මහඟු අවස්ථාවක් හා පරිසරයක්

තනා දුන්

මගේ පංතිභාර ගුරුතුමිය වන දමයන්ති රත්නායක ගුරු මෑණියන්ටත්,

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියේ සම්භන්ධීකාරක තුමිය වන සමන්මලී ගුරු මෑණියන්ටත්,

එම ව්‍යාපෘතියේ නිර්මාපක

සෙනවිරත්න මහලේකම්ගේ ගුරු පියාණන්ටත්

ප්‍රාථමික අංශයේ විදුහල්පතිතුමියටත්

අප විද්‍යාලයේ විදුහල්පතිතුමියටත්

ISBN කේත ලබාගැනීම සඳහා නොමඳ සහයක් ලබා දුන්

4 ශ්‍රේණියේ සතිනි දියණියගේ මව වන


ලුම්බිණි මහත්මියටත්

ආදරණීය තාත්තාටත්, අම්මාටත්, සහ

අයියාට


මගේ හද පිරි ස්තුතිය පිරිනමමි.

දවසක් දා ඉබි හාමි අපේ ගෙදර තියන පොකුණ ගාවට ඇවිත් දුකෙන් බලාගෙන ඉන්නවා මම දැක්කා.




මට හොඳටම දුක හිතුනා.

මට හොඳටම දුක හිතුනා ඉබි හාමි ගැන.




මම අම්මාට හොරෙන් ඉබි හාමිට කෙසෙල් ගෙඩියක් දුන්නා.




අනේ පව් එයාට කන්න බෑනේ.

එයා කල්පනා කරනවා මොකක් හරි .



මොකක්ද කල්පනා කරන්නේ...

අනේ ඉබි හාමි මොනවා කල්පනා කරනවා ඇතිද?




මම එයාට බොන්න වතුර දුන්නා.




අනේ ඇයි, ඉබි හාමි මං දෙන මොකුත් කන්නේ නැත්තේ?
මාත් එක්ක තරහ වෙලද?

පොඩි ළමයි තරහ වෙන්න හොඳ නෑ කියලා අපේ අම්මා කියනවා.




ඉබි පැංචෝ... අනේ ඉබි හාමි... කෝ... ඔයා කොහෙද ඔයා හැංගුනේ කියන්නකෝ?

මට දුකයි ගොඩක් ඔයා මාත් එක්ක සෙල්ලම් කරන්නවත් එන්නේ නෑ.




ඉන්නකෝ...... පොඩ්ඩක් මං අම්මාව එක්කන් එනකන්..




අම්මේ මේ බලන්නකෝ... මේ... ඉබි හාමි මුකුත් කන්නෙම නෑ...

ඇයි දන්නෙ නෑ නේද? අනේ...අම්මේ බලන්නකෝ... එයාට සනීප නැද්ද කියලා...



ඉබි පැංචා හරිම අහිංසකයි... අපි එයාව ආදරෙන් බලාගමු අම්මේ...



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා ප්‍රංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වු මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හිස්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01